**ශීර්ෂය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

## 1 කොටස

**පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 2 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.5,480,654,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.4,952,239,985 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.3,214,558 ත් රු.495,118,478 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.27 ත් සියයට 10.22 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 174 | 539,880,000 | 509,799,021 | 30,080,979 | 5.57 |
| 232 | 4,842,724,000 | 4,347,605,522 | 495,118,478 | 10.22 |
| 326 | 98,050,000 | 94,835,442 | 3,214,558 | 3.27 |
| **එකතුව** | **5,480,654,000** | **4,952,239,985** | **528,414,015** | **9.64** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් එකතුව රු.4,930,000 ක් වූ ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය | 2013 දෙසැම්බර් 31 දිනට ලද ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ලද ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 4,910,000 | 3,612,164 | 1,297,836 | 26 |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 20,000 | 9,033 | 10,967 | 54.8 |
| **එකතුව** | **4,930,000** | **3,621,197** | **1,308,803** | **26.55** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 2 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17401 | 3,500,000 | 3,491,470 | 1,000,000 | 1,602,250 | 15,000,000 | 8,106,258 |
| 23201 | 140,000,000 | 94,177,993 | 110,000,000 | 115,815,477 | 500,000,000 | 264,414,055 |
| 32601 | 5,000,000 | 3,184,819 | 2,500,000 | 4,018,326 | 25,000,000 | 14,061,928 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 23202 | 90,000,000 | 65,316,443 | 115,000,000 | 124,038,887 | 30,000,000 | 56,311,348 | 12,000,000 | 651,865 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමෙහි මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| **විෂය අංකය** | **අත්තිකාරම් ගිණුම් කටයුත්ත** | **මූල්‍ය ප්‍රතිඵල** | | | |
|---|---|---|---|---|---|
| | | **2013** | | **2012** | |
| | | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව** |
| | | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| 23202 | බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් කටයුතු | 38,030,390 | (5,513,757) | 45,566,785 | 22,995,444 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 2 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.28,508,336 ක් විය. විස්තර පහත දැක්වේ

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **අග්‍රිම ගිණුම් අංකය** | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.** |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 7002/0000/00/0411/0013/000 | 2,143 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 7002/0000/00/0078/0013/000 | 1,656,050 |
| එම | 7002/0000/00/0079/0013/000 | 26,733,702 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0412/0013/000 | 116,441 |
| **එකතුව** | | **28,508,336** |

## 2.3.2 පොදු තැන්පත් ගිණුම්

-----------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තු 2 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.141,932,473 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **තැන්පත් ගිණුම් අංකය** | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0179/000 | 1,103,835 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව- | | |
| තැන්පත් ඇප | 6000/0000/00/0001/0061/000 | 70,738,819 |
| තැන්පත් - ටෙන්ඩර් | 6000/0000/00/0002/0017/000 | 4,622,021 |
| සිරකරු සුභසාධක අරමුදල | 6000/0000/00/0006/0028/000 | 6,589,141 |
| සිරකරු වේතන සහ පුද්ගලික මුදල් ගිණුම | 6000/0000/00/0006/0081/000 | 4,646,188 |
| විවිධ තැන්පත් ගිණුම | 6000/0000/00/0006/0081/000 | 54,073,509 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0180/000 | 158,960 |
| **එකතුව** | | **141,932,473** |

## 2 කොටස

----------

### එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

-----------------------------------------------------------

## 1. ශීර්ෂය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

### 1.1 විගණන විෂය පථය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 18 වන දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

**----------------------------------**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.4,716,594 ක් විය.

**(ඇ) අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). මුදල් රෙගුලාසි 371ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 4 කදී එකතුව රු.70,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii). මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්ය නිමවී මාස 2 ක ප්‍රමාදයකින් පසුව අවස්ථා 2 ක දී එකතුව රු.35,000 ක අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

(iii). අත්තිකාරම් ලබාගත් නමුත් වියදම් කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් ඉදිරි සතියේ පළමු දිනම එම මුදල් නැවත තැන්පත් කළ යුතු වුවත්, අවස්ථා 7 කදී ලබාගත් එකතුව රු.85,000 ක් වූ අත්තිකාරම් මුදල් ප්‍රමාදවී පියවා තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**අභ්‍යන්තර විගණනය.**

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර තිබුණද ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාලය සහ ඊට අයත් ආයතනවල භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

---

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

---

2012 දෙසැම්බර් 28 දිනැති අංක 157 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව දිනපොත්, සුබපැතුම් පත් වැනි අත්‍යාවශ්‍ය නොවන දේ සඳහා රජයෙන් දරන වියදම් සීමා කළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා දිනපොත් සහ සුබපැතුම් පත් සඳහා රු.535,722 ක් වැය කර තිබුණි.

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා.

---

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් සැලැසුම් කරන ලද "පුනරුද මිත්‍රත්ව" ගම්මාන සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.8 කාර්යසාධනය

---

2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු පහත දැක්වෙන කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

(අ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ප්‍රතිසංස්කරණයට අවශ්‍ය අණපනත් සම්පාදනය කිරිම.

(ආ) පුනරුත්ථාපන කටයුතු කාලීන අවශ්‍යතා අනුව පුළුල් කිරීම සඳහා 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරී පනත සංශෝධනය කිරීම.

(ඇ) සුළු අපරාධවලට දඬුවම් ලබන්නන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ප්‍රජා විශෝධන ක්‍රියාවලියකට යොමුකිරීම සඳහා ප්‍රජා විශෝධන ආඥා පනත සංශෝධනය කිරීම.

## 1.9 අවිධිමත් ගනුදෙනු.

---

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) අමාත්‍යතුමාගේ නිල නිවසේ ජල ටැංකියක් හා මුර කුටියක් ඉදිකිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. එහි කොන්ත්‍රාත් වටිනාකම රු.2,124,611 ක් වී තිබුණි. එම කොන්ත්‍රාත් සම්බන්ධව එළඹුණු ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුම, සවිස්තරාත්මක

ඇස්තමේන්තුව, ප්‍රමාණ පත්‍ර, කළ වැඩ පිළිබඳ ප්‍රගති වාර්තා යනාදී ලියකියවිලි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2013 දෙසැම්බර් 23 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වැඩ අවසන් කළ බවට විධිමත් පරිදි සහතික කර නොගෙන ඉදිරිපත් කර තිබූ රු.2,357,932 ක බිල්පත් වටිනාකමින් රු.2,309,440 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවා තිබුණි.

(ආ) අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් රු.1,771,885 ක් වැය කර 2010 ජුනි මාසයේදී එන්ජිම පූර්ණ අළුත්වැඩියාවක් (ඕවර් හෝල්) කර තිබුණි. අපරික්ෂාකාරී ධාවනය නිසා කි.මී.17,000 ක් යැමට පෙර නැවත එන්ජිම පූර්ණ අළුත්වැඩියාවක් සිදුකිරීමේ තත්ත්වයට පත්වී තිබුණි. නැවත අළුත්වැඩියා කිරීමකින් තොරව පරිසර අමාත්‍යාංශයේ ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය මත රු.680,000 ක වියදමින් 4D56 ටර්බෝ ඉන්ටකූලර් එන්ජිමක් 2012 ජුනි මාසයේදී සවිකර තිබූ අතර ඊට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම එන්ජිමේ ධාරිතාවය පෙර පැවති එන්ජිමේ ධාරිතාවයට වඩා අඩු බවත්, එම සවිකිරීමෙන් පසු අවස්ථා 10 කදී රු.419,017 ක අළුත්වැඩියාවන්ද කර තිබුණි. දැනට මෙම රථය අක්‍රිය වී තිබුණි.

## 1.10 වංචනික ස්වරූපයේ ගනුදෙනු.

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අමාත්‍යාංශයේ ජීප් රථයක හා ඩබල් කැබ් රථයක එන්ජින් ගලවා තිබුණි. ඉවත්කරන ලද එන්ජින්වල සුළු කොටස් කිහිපයක් පමණක් භාරදී 2013 අගෝස්තු 07 දින එම කොටස් රු.2,000 කට වෙන්දේසි කර තිබුණි.

## 1.11 කළමනාකරණ දූර්වලතා.

නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් දූර්වලතා අනාවරණය විය.

(අ) පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ උපදේශක තනතුර සඳහා 2013 ජනවාරි 16 දින අංක MRPR/2/3/2/6 දරන පත්වීම් ලිපිය මගින් එක් වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියෙකු 2013 ජුලි 03 දින ඉල්ලා අස්වී තිබුණි. මෙම පත්වීම් ලිපියේ 04 වන වගන්තිය ප්‍රකාරව තනතුරින් ඉල්ලා අස්වන්නේ නම් ලිත්

මාසයකට පෙර දැනුම් දීම හෝ මාසයක වැටුප රජයට ගෙවිය යුතු වුවත්, එසේ සිදුකර නොතිබූ අතර, නැවත 2013 සැප්තැම්බර් 28 දින සිට සේවයේ පිහිටුවා තිබුණි.

(ආ). 2013 ජනවාරි 04 දින කොළඹ පිහිටි අවන්හලක මාධ්‍ය හමුවක් සඳහා "කොක්ටේල්" සාදයක් පවත්වා තිබුණි. ආහාර පාන සඳහා දරන ලද රු.165,032 ක වියදම වෙනත් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ). අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයට අවශ්‍ය වීඩියෝ සංස්කරණ යන්ත්‍රයක් මිලදී ගැනීමට 2011 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද, එය ඉටුකර නොගෙන වර්ෂය තුළදී වීඩියෝ සංස්කරණය සඳහා යන්ත්‍රයක් කුලියට ලබාගෙන කුලී ගාස්තු වශයෙන් රු202,500 ක් ගෙවා තිබුණි.

## 1.12 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 10 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 68 | 39 | 31 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 18 | 01 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 40 | 42 | - | 02 |
| | **එකතුව** | **140** | **111** | **33** | **04** |

ඉහත කාර්ය මණ්ඩල තොරතුරු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 33 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii). බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවකින් ලිපිකරු, වැඩසටහන් සහකාර, කාර්යාල කාර්ය සහායක යනාදී කාර්යමණ්ඩල අමාත්‍යාංශයේ සේවයේ යොදවාගෙන තිබුණි.

## 2. ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව.

### 2.1 විගණන විෂය පථය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 31 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| ස්ථාවර වත්කම් ලේඛන. | මුදල් රෙගුලාසි 502(2) හා 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) සීමා පිළිනොපැදීම**

දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාලව පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද නොතිබුණි.

| විෂය අංකය | | හර ශේෂය | |
|---|---|---|---|
| | උපරිම සීමාව | සත්‍ය | ඉක්මවීම |
| | රු. | රු. | රු. |
| 23202 | 30,000,000 | 56,311,348 | 26,311,348 |

**(ඇ) අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 23201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂයෙහි එකතුව රු.8,109,355 ක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සැසදීමේදී රු.308,907 ක වෙනසක් විය.

**(ඉ) වාණිජ අත්තිකාරම් ගිණුම්**

**-------------------------**

දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණු බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විධිමත් පරිදි ගිණුම්කරණ කටයුතු ඉටු නොකිරීම නිසා මහර, වැලිකඩ හා අනුරාධපුර බන්ධනාගාරවල ගැනුම්, විකුණුම් හා තොග පිළිබඳ ඌනතා පැවති අතර, එයින් ශුද්ධ ලාභයට බලපෑම් සිදුවී තිබුණි.

(ii) මහර බන්ධනාගාරයේ මැහුම් අංශයේ අවසන් තොගය භෞතික සමීක්ෂණයකින් තොරව ලෙජරයේ සඳහන් ශේෂ පදනම් කරගෙන දක්වා තිබුණි. වර්ෂය තුළ භාවිතා කරන ලද රු.121,745 ක් වටිනා අමුද්‍රව්‍ය ලෙජරයේ සඳහන් ශේෂයෙන් අඩුකර නොතිබූ බැවින් අවසන් තොගය වැඩිවීම නිසා කේවල ගිණුමේ අමුද්‍රව්‍ය පිරිවැය සෘණ අගයක් ගෙන තිබුණි. පේෂකර්ම අංශයේ රු.204,978 ක් වූ විකුණුම්, තොගයෙන් ඉවත් නොකිරීම සහ විකුණුම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා රු.204,978 ක අලාභයක් පෙන්නුම් කර තිබුණි.

(iii) වැලිකඩ බන්ධනාගාරයේ ගරාජ අංශයේ රු.427,497 ක ලැබිය යුතු ආදායමක් ගිණුම්වලට ගෙන නොතිබුණි. කොහු ඉදල් කර්මාන්ත අංශයේ රු.396,436 ක ණයට ගැනුම්, ගිණුම්ගත නොකිරීම සහ එම තොග අවසන් තොගයට ඇතුළත් කිරීම හේතුවෙන් එය සාවද්‍ය ලෙස වර්ෂයේ ශුද්ධ ලාභය වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**------------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත විග්‍රහකර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) අනුරාධපුර බන්ධනාගාරය භාවිතයෙන් ඉවත් කර තිබුණු ඇග්‍රිමෙක් අත්ට්‍රැක්ටරය හා සුළං බල යන්ත්‍රය වසර ගණනාවක සිට ක්‍රියාවිරහිතව පැවති අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුරාධපුර බන්ධනාගාරයේ භූමිය තුළ වැන් රථයක් දිරාපත් වෙමින් පැවති අතර, එම රථයට අදාල ලිපිලේඛනද ආයතනය සතුව නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104 | 4,353,265 | හානි හා පාඩු පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | 3,559,134 | සිදුවී තිබූ සියළු හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි |
| (iii) මුදල් රෙගුලාසි 502(ආ) | 60,875,367 | බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුමේ ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිත්‍ය නියෝග** | | |
| (i) නිත්‍ය නියෝග 673 හා 685 | - | සිරකරුවන්ගේ හොඳ හැසිරීම නිසා ලබාගත් ලාංඡන 3 ක් හෝ හතරක් ඇති අය බැහැර |

| | | | |
|---|---|---|---|
| | | | ස්ථානවල වැඩ සඳහා යෝග්‍ය බව දක්වා තිබුණත්, දරුණු ගනයේ අපරාධවලට සම්බන්ධ සිරකරුවන් පිටත වැඩ කණ්ඩායම්වල යෙදවීම නිසා පැනයාමේ අවස්ථා වාර්තාවී තිබුණි. |
| (ii) | නිත්‍ය නියෝග 911 | - | ගොවිපලෙහි නිපදවන සියළු අස්වැන්න ඇතුළත් රෙජිස්ටරයක් පවත්වාගත යුතු වුවත්, අනුරාධපුර බන්ධනාගාරයේ එවැනි ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (iii) | නිත්‍ය නියෝග 914 | - | අනුරාධපුර බන්ධනාගාරයේ සහ මහර බන්ධනාගාරයට අයත් මීතිරිගල හා කන්දෙවත්ත කඳවුරුවල සත්ව තොග ලේඛන නිත්‍ය නියෝගවල සඳහන් පරිදි සකස්කර නොතිබුණි. |
| (iv) | නිත්‍ය නියෝග 909(ඒ) හා 909(බී) | - | ගොවිපල පිළිබඳ ලිපිගොනුවක් සකස්කර එක් එක් ඒකකය පිළිබඳ විස්තර හා තොරතුරු ඇතුළත් කළ යුතු වුවත්, අනුරාධපුර බන්ධනාගාරයේ එවැනි ගොනුවක් පවත්වා නොතිබුණි. |

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

-------------------------------------------

දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම.**

**---------------------------------------------**

කුරුවිට බන්ධනාගාරයට නිල නිවාසයක් ඉදිකිරීම හා මැගසින් බන්ධනාගාරයේ මුළුතැන්ගෙය ඉදිකිරිමට 2001, 2004 සහ 2009 වර්ෂවල රු.6,845,500 ක අත්තිකාරම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්.**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නගර ආශ්‍රිතව ඇති බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහර, වටරැක හා කළුතර බන්ධනාගාර ආයතනවල ඉදිකිරීම් කටයුතු සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් රුපියල් මිලියන 355 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කොළඹ බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සළසා තිබූ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 240.3 ක් තංගල්ල අගුණකොලපැලැස්ස නව බන්ධනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියට මාරුකර තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතියට 2013 වර්ෂය සඳහා සළසා තිබූ මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන 355 ක් වී තිබුණද, 2013 වර්ෂය තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති.**

**------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාරියපොල බන්ධනාගාරයේ රැඳවියන් 500 ක් සඳහා දෙමහල් සිරවාට්ටුවක් ඉදිකිරීමට 2008 වර්ෂයේදී රු.8,500,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තු කර තිබුණත්, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ප්‍රමාදවීම හේතුවෙන් 2013 දෙසැම්බර් වන විට රුපියල් මිලියන 5.5 ක් වියදම් කර තිබුණි. එදින වන විට මුළු ඉදිකිරීම්වලින් සියයට 40 ක් පමණ වූ ගොඩනැගිල්ලේ අඩි 6 ක උස ප්‍රමාණයක් පමණක් ඉදිකර තිබුණි.

(ii) වව්නියාව බන්ධනාගාරයේ රැඳවියන් සඳහා දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී රුපියල් මිලියන 29.68 ක් ලබාදී තිබූ අතර එහි සැලැස්ම වෙනස් කර පහළ මාලයේ මුළුතැන්ගෙයක් හා ඉහළ මාලයේ නිලධාරී විවේකාගාරයක් ඉදිකිරීම නිසා රැඳවියන් වෙත ප්‍රමාණවත් ඉඩ පහසුකම් සැළසී නොතිබුණි.

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------**

**අක්‍රීය බැංකු ගිණුම්**

**--------------------**

බන්ධනාගාර රැඳවියන්ගේ වැටුපෙන් සියයට 10 ක් බැගින් ලබාගෙන බන්ධනාගාර ත්‍යාග අරමුදල නමින් රාජ්‍ය බැංකුවක ගිණුමක් ආරම්භකර තිබූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමෙහි රු.3,832,383 ක ශේෂයක් නිෂ්ක්‍රියව පැවතුණි. මෙම ගිණුමට ලැබෙන ආදායම් බැර කරන නමුත් මාසික ගිණුම් විස්තර ද ලබාගෙන නොතිබුණි.

**2.8 අවිධිමත් ගනුදෙනු.**

**-------------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම.**

---------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). දුම්බර බන්ධනාගාරයට වාෂ්ප බොයිලේරු දෙකක් සහ කල්දේරම් මිලදී ගැනීමට රුපියල් මිලියන 12 ක් වෙන්කර තිබූ අතර මේ සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. වාෂ්ප බොයිලේරු මිලදී ගැනීමක් පමණක් නොව එය සවිකිරීමේ ක්‍රියාවලිය ගැන අවධානය යොමු නොකිරීම නිසා ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබූ අතර, මිල ගණන් ඇගයීමට භාජනය කළද ලංසුකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළ අසම්පූර්ණ මිල ගණන් පදනම් කර ගෙන සාධාරණ ලංසු ඇගයීමකින් තොරව රුපියල් මිලියන 30.6 කට ලංසුකරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණි. බොයිලේරුව ස්ථාපනය කිරීමේ කාර්ය විධිමත් ලෙස සැලැසුම් නොකිරීම නිසා මුළුතැන්ගෙයි සමහර ඉදිකිරීම් වෙනස් කිරීමට සිදුවී තිබුණි. බොයිලේරු සවි කිරීමෙන් පසු ඒවාට වෙනස් ලිහිසි තෙල් වර්ගයක් යෙදවීම හේතුවෙන් ඇතිවූ කාර්මික දෝෂයන් නිසා රැඳවියන්ගේ ආහාර පිසීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීමට නොහැකි වී තිබුණි. දැනට එක් බොයිලේරුවක් අක්‍රීය තත්වයේ පැවැතුණි.

(ii). වැලිකඩ හා පල්ලෙකැලේ බන්ධනාගාර ගරාජවලට රුපියල් 6,174,000 ක් වූ බර එසවුම් යන්ත්‍ර 4 ක් හා ඊට අදාල උපාංග සීමිත මිල කැඳවීම් යටතේ කටයුතු කර මිලදී ගෙන

තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශවලට පටහැනිව ප්‍රසම්පාදන කමිටුවකට සීමිත මිල ගණන් කැඳවීම යටතේ මිලදී ගත හැකි උපරිම සීමාව රු. මිලියන 2 ක් වුවත්, එම සීමාව ඉක්මවා මිලදී ගැනීම සිදු කර තිබුණි. එසේ මිලදී ගත් රු.මිලියන 3 කට වැඩි වටිනාකමෙන් යුත් බර එසවුම් යන්ත්‍ර 02 ක් විදුලිබලය ප්‍රමාණවත් පරිදි නොලැබීම මත පල්ලෙකැලේ බන්ධනාගාරයේ නිෂ්ක්‍රියව පැවතුණි.

(iii). පල්ලෙකැලේ බන්ධනාගාරයේ සපත්තු නිෂ්පාදන අංශය වසාදමා අධික වටිනාකමකින් යුත් යන්ත්‍ර සහ අමුද්‍රව්‍ය පල්ලන්සේන තරුණ වරදකරුවන් විශෝධන මධ්‍යස්ථානයට මාරුකර තිබුණද, සපත්තු නිපදවීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 95 | 38 | 57 | - |
| (ii) | තෘතියික මට්ටම | 53 | 21 | 32 | - |
| (iii) | ද්විතියික මට්ටම | 7,098 | 5,565 | 1,533 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 364 | 289 | 75 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 15 | - | 15 |
| | **එකතුව** | **7,610** | **5,928** | **1,697** | **15** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,697 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ii). බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3. ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව.

---

### 3.1 විගණන විෂය පථය

---

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 23 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.

#### (ආ) අයවැය විචලනය

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 සිට සියයට 70 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 3.4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ගෙවීම් වවුචර් සංනිරීක්ෂණය පමණක් සිදු කර තිබුණු බැවින් ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

#### 3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ පොදු රැස්වීම්වලට පමණක් සහභාගි වී තිබුණි.

## 3.5 බේරුම් නොකළ බැරකම්

----------------------------

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම ශේෂය රු.603,311 ක් වී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

-----------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **( අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 447(2) | වැය ලෙජරයේ එක් එක් වැය විෂයය යටතේ දක්වා ඇති ප්‍රතිපාදනය නිවැරදි බවට මාණ්ඩලික නිළධාරියෙකු විසින් සහතික කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 447(3) | අතිරේක ප්‍රතිපාදන ලැබීම් රතු තීන්තෙන් සටහන් කොට මුල් ප්‍රතිපාදනයට එකතු කර දක්වා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 66 හා 69 විධිවිධාන යටතේ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමේදී ප්‍රතිපාදන අඩු කිරීම් කරන වැය විෂයයේ මුළු ප්‍රතිපාදනයෙන් අඩුකර දක්වා නොතිබුණු අතර ඒ පිළිබඳ මාණ්ඩලික නිළධාරියෙකුගේ අවධානයද |

| | |
|---|---|
| | යොමුවී නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 447(8) | වැය ලෙජරය තුලනය කර නොතිබුණි. |

**(ආ). රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | |
|---|---|
| 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘතිය නිම නොකර අතහැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය<br>රු. | ආරම්භ කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම<br>රු. | අත්හැර දැමීමට හේතුව |
|---|---|---|---|---|
| කුරුණෑගල ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,333,472 | 2012.12.12 | 208,417 | ඉදිකිරීම් භූමිය රජයට අත්පත් කර ගැනීමට ඇති දුෂ්කරතාව |

## 3.8 කාර්යසාධනය.

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්.**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් ලෙස ඉටුකර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i). ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ මහේස්ත්‍රාත්වරු සහ නීතිඥවරු දැනුවත් කිරීමේ වැඩමුළු 20 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද, වැඩමුළු 12 ක් පමණක් පවත්වා තිබුණු අතර දෙපාර්තමේන්තුවේ සියළු කාර්යයන් පරිගණකගත කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ද අවසන් කර නොතිබුණි.

(ii). ප්‍රජා සේවා ව්‍යාපෘති වැඩ සටහන යටතේ කෘෂි වගා ව්‍යාපෘති 52 ක් ද පැළ තවාන් හා වන වගා ව්‍යාපෘති 20 ක් ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, කෘෂි ව්‍යාපෘති 40 ක් සහ පැළ තවාන් හා වන වගා ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii). මානව සම්පත් සංවර්ධනය වැඩසටහන යටතේ වැඩ පරීක්ෂකවරුන් තිදෙනෙකු සහ අනෙක් කාර්ය මණ්ඩල නිලධාරීන් තිදෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, වැඩ පරීක්ෂකවරුන් දෙදෙනෙක් සහ අනෙක් කාර්ය මණ්ඩල නිලධාරීන් එක් අයෙකු සඳහා පමණක් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා.**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 04 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 102 | 99 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 454 | 292 | 162 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 05 | 06 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 05 | - | 05 |
| | එකතුව | **583** | **405** | **183** | **05** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 183 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්.**

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස නිදහස් කර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| ලිපිකරු | 02 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 2011 වර්ෂයේ සිට මේ දක්වා |
| කම්කරු | 01 | එම | එම |

ලිපිකරු තනතුරු වල පුරප්පාඩු පැවතියද මෙම නිලධාරීන් උක්ත අමාත්‍යාංශයේ රාජකාරි කටයුතුවල අනුයුක්ත වෙමින් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවෙන් වැටුප් ලබාගන්නා අතර, සමාලෝචිත වර්ෂය තුළදී රු.835,634 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.